ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය                                    301

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන2022/2023

5 වන මට්ටම - අවසාන පරීක්ෂණය

**EPU5551 - ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපනයේ පදනම**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - **2024.02.24**                    වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද 2 වන කොටසේ තෝරාගත් ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 01 වන කොටස

01. "අධ්‍යාපනය" යන සංකල්පය සුදුසු නිර්වචනයක් යොදාගෙන කෙටියෙන් පැහැදිලි කරන්න.

02. අධ්‍යාපනය පිළිබඳ ප්ලේටෝ ඉදිරිපත් කරන ලද ප්‍රධාන අදහස් දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න.

03. "දැන ගැනීම සඳහා ඉගෙනුම" යන යෙදුම සුදුසු උදාහරණ දෙකක් (02) සපයමින් විස්තර කරන්න.

04. "අධ්‍යාපන දර්ශනය සත්‍ය පන්ති කාමරය තුළ ඉගැන්වීමේදී සියළු ගුරුවරුන්ට ඉතා වැදගත් වේ." ගුරුවරයෙකුට අධ්‍යාපනය දර්ශනයෙන් ලබාගත හැකි ප්‍රයෝජන තුනක් (03) කෙටියෙන් සාකච්ඡා කරන්න.

05. රූසෝ විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යාපන අවධීන් පහ (05) ලැයිස්තු ගත කර, එම එක් එක් අවධියේදී දෙමව්පියන්ගේ ප්‍රධාන භූමිකා කෙටියෙන් පැහැදිලි කරන්න.

06. මාරියා මොන්ටිසෝරි විසින් හඳුන්වා දෙන ලද මූලික ප්‍රතිපත්ති තුනක් (03) ලැයිස්තු ගත කර කෙටියෙන් පැහැදිලි කරන්න.

07. "සමාජානුයෝජනය" යන යෙදුම පිළිගත් නිර්වචනයක් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

08. මහත්මා ගාන්ධිගේ අධ්‍යාපනය පිළිබඳ අදහස් වල මූලික ලක්ෂණ පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 02 - වන කොටස

09. (i.) රූසෝ විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යාපනයේ ප්‍රධාන මූලධර්ම පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) එම මූලධර්ම ප්‍රාථමික පාසල් ගුරුවරුන්ට පාඩම් සැලසුම් කර පන්තිකාමරය තුළ ඉගැන්වීමේදී ප්‍රයෝජනවත් වන අයුරු උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු - 10)

10. (i.) ජෝන් ඩූවි විසින් අධ්‍යාපනය පිළිබඳ ඉදිරිපත් කරන ලද මූලික අදහස් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 08)

(ii.) පන්තිකාමර වල උගන්වන ගුරුවරුන්ට ජෝන් ඩූවිගේ එම අදහස් භාවිත කළ හැක්කේ කෙසේදැයි උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු - 12)

11. (i.) පිළිගත් නිර්වචනයක් භාවිත කරමින් සංවර්ධනය යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු - 05)

(ii.) අධ්‍යාපනය සහ සංවර්ධනය අතර, ඇති සම්බන්ධතාවය උදාහරණ දක්වමින් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු - 07)

(iii.) "අධ්‍යාපනය ආයෝජනයක් ලෙස සැලකේ." ඉහත සඳහන් සංකල්පයට අදාලව ශ්‍රී ලංකාවේ වර්තමාන පාසල් අධ්‍යාපන පද්ධතියට ඇතුලත් කළයුතු අංග සාකච්ඡා කරන්න. (ලකුණු - 08)

12. (i.) වර්තමාන ශ්‍රී ලංකාවේ තරුණයන්ට බලපාන සංස්කෘතික සම්මතයන් හතරක් (04) නම් කරන්න. (ලකුණු - 04)

(ii.) "ප්‍රාථමික සමාජානුයෝජනය" සහ "ද්විතික සමාජානුයෝජනය" අතර ඇති වෙනස උදාහරණ සමඟින් දක්වන්න. (ලකුණු - 08)

(iii.) ළමුන් තුළ සමාජානුයෝජනය ඇති කිරීමේ ප්‍රධාන කාරණයක් ලෙස සැඟවුන විෂය මාලාවේ භූමිකාව අගයන්න. (ලකුණු - 08)

13. පහත සඳහන් ඕනෑම දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i.) දරුවන් රැකබලාගැනීමේ ක්‍රම
(ii.) සමාජානුයෝජනයේදී සම වයස් කණ්ඩායම් වල භූමිකාව
(iii.) පාසල සමාජානුයෝජන කාරකයක් ලෙස
(iv.) මිනිසාගේ ස්වභාවය පිළිබඳ කාල් මාර්ක්ස් අදහස්

(ලකුණු 10 x 2 = 20)

- සියළුම හිමිකම් ඇවිරිණි. -